සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

## ඉතිහාසය I, II

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I - පත්‍රය

සැලකිය යුතුයිඃ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පළමුවන විමලධර්මසූරිය රජු ඉදිරියේ රජුට අගෞරව වන ලෙස කටයුතු කළ ලන්දේසි ජාතිකයා කවුරුන්ද?
    (i) ස්පිල්බර්ජන් (ii) සිබෙල් ද වර්ට් (iii) ජෙරාඩ් හල්ෆ්ට් (iv) කලන් අල්බස්

02. ලන්දේසීන් විසින් අල්ලාගත් කුඩා බලකොටුවක් වන්නේ,
    (i) යාපනය (ii) මන්නාරම (iii) අලිමංකඩ (iv) මඩකලපුව

03. සියම් නිකාය ආරම්භ කිරීමට මූලිකත්වය ගත් උඩරට රජු කවුරුන්ද?
    (i) I විමලධර්මසූරිය රජු (ii) ශ්‍රී වීර පරාක්‍රමනරේන්ද්‍ර සිංහ රජු (iii) දෙවන විමලධර්මසූරිය රජු (iv) කීර්ති ශ්‍රී රාජසිංහ රජු

04. කංකානම් යනු ............................ ප්‍රදේශයේ භාවිතා වූ පැරණි නිල නාමයකි.
    (i) යාපනය (ii) උඩරට (iii) ගාල්ල (iv) කොළඹ

05. රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා උඩරට ගිවිසුම සඳහා අත්සන් කරනු ලැබුවේ බ්‍රිතාන්‍යයේ කිනම් රජු වෙනුවෙන් ද?
    (i) I ජෝර්ජ් (ii) II ජෝර්ජ් (iii) III ජෝර්ජ් (iv) IV ජෝර්ජ්

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

06. මුස්ලිම් ලීගය පිහිටුවීමට මූලිකත්වය ගනු ලැබුවේ ............................ විසින්ය.

07. අනුරාධපුරයේ නටබුන්ව ගිය බෞද්ධ පූජනීය ස්ථාන ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපාරය........................ මහතා ආරම්භ කරන ලදි.

08. එංගලන්තයේ ..............................උද්‍යානයේ වගාකර තිබූ රබර් පැළ කිහිපයක් ලංකාවට ගෙන එන ලදි.

09. 1848 නිදහස් සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ ........................... ප්‍රදේශයයි.

10. "මුහුදුබඩ සිට රටතුළට සිංහල ගව්වක ප්‍රමාණය ලන්දේසීන්ට අයත්ය'' යන වගන්තිය ............ ගිවිසුමේ සඳහන් ය.

(1766, පියදාස සිරිසේන, මාතලේ, ලුල්කඳුර, වෙල්ලස්ස, මොහොමඩ් අලිජින්නා , වලිසිංහ හරිස්චන්ද්‍ර, 1815, කිව් , අගාඛාන්)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙන් දී ඇති වරහන තුළ යොදන්න.**

11. 1931 දී ගාන්ධිතුමා හා ඉන්දියානු ප්‍රතිරාජයා අතර ඇතිකරගත් ගිවිසුම ගාන්ධි - අර්වින් ගිවිසුම ලෙස හැඳින්වේ. (............)
12. "ටජ්මහල" නිර්මාණය කරන ලද්දේ මහා අක්බාර් රජුය. (............)
13. යාපනය ශිවන්ගල විද්‍යාලය පසුකලෙක යාපනයේ හින්දු විද්‍යාලය ලෙස හැඳින්වීය. (............)
14. "ලංකා නිධානය" මිෂනාරීන් විසින් මුද්‍රණය කරන ලද ප්‍රකාශයකි. (............)
15. 1797 වර්ෂයේ ඇති වූ මුහුදුබඩ කැරැල්ල පිළිබඳ තොරතුරු සොයා බැලීමට පත් කරන ලද කොමිසම කෝල්බෲක් කොමිසමයි. (............)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර හිස්තැන මත ලියා දක්වන්න.**

16. ලන්දේසි අධිකරණ පද්ධතිය තුළ පහළම උසාවිය .................................................... උසාවිය වේ.
17. 1800 වර්ෂයේ දී උඩරටට හමුදාව රැගෙන ගිය ඉංග්‍රීසි සෙනෙවියා ....................... නමින් හඳුන්වයි.
18. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු පිටුවහල් කරනු ලැබුවේ ඉන්දියාවේ ............................................ය.
19. ඕල්කට්තුමාගේ සේවාවන් ලෙස ..................................... කොඩිය නිර්මාණය හඳුනාගත හැකිය.
20. ........................................සීක් ජනතාව අතර සංස්කෘතික ප්‍රබෝධයක් ඇති කිරීමට දායක වූ සංවිධානයකි.

(ලකුණු 2 x 20 =40)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024**
**Second Term Test - Grade 09 - 2024**

# ඉතිහාසය II

සැලකිය යුතුයි :

- පළමු ප්‍රශ්නය සඳහා අනිවාර්යෙන්ම පිළිතුරු සැපයිය යුතුය.
- දෙවන කොටසින් තෝරා ගත් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.

## I කොටස

01.(අ) (i) A පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
(ii) එය අයත් සමාගම පිහිට වූ වර්ෂය කුමක් ද?
(iii) මෙය අයත් යුරෝපා ජාතිය කවුරුන් ද?
(iv) ඔවුන්ගේ පෙරදිග මූලස්ථානය පිහිට වූ දූපත කුමක් ද?



A රූපය
(ලකුණු 04)

(ආ) (i) B පින්තූරයෙන් දැක්වෙන්නේ කවුරුන් ද?
(ii) මෙම පුද්ගලයා හා සම්බන්ධ කැරැල්ල කුමක් ද?
(iii) එම කැරැල්ල ඇතිවීමට හේතුවක් වූ රයිෆල් වර්ගය කුමක් ද?
(iv) එම කැරැලිකරුවන් විසින් ඉන්දියාවේ අධිරාජ්‍යයා බවට පත්කරන ලද පුද්ගලයා කවුරුන්ද?



B රූපය
(ලකුණු 04)

(ඇ) (i) මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කවුරුන් ද?
(ii) මෙතුමා උපත ලැබුවේ කොහේ ද?
(iii) මෙතුමාගේ බිරිඳගේ නම කුමක් ද?
(iii) මෙතුමා ආරම්භ කරන ලද සමාගම නම් කරන්න.



(ලකුණු 04)

(ඇ) (i) පෘතුගීසීන්ගේ පෙරදිග මූලස්ථානය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) **(C)** අක්ෂරයෙන් දැක්වෙන මොහොමඩ් අලිජින්නාගේ නායකත්වයෙන් පිහිට වූ රටයි. එය නම් කරන්න.


(ලකුණු 02)




(ඉ) (i) බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ශ්‍රී ලංකාව වෙත යොමු වීමට හේතුවක් වූ වරාය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) දෙවන රාජසිංහ රජු හා ලන්දේසීන් අතර ගැටුම් ඇති වූ බලකොටුවක් **(B)** අක්ෂරයෙන් දැක්වේ. එම බලකොටුව කුමක් ද?

(ලකුණු 02)




## II - කොටස

02. (i) පහත රජවරුන් හමුවූ ලන්දේසි දූතවරයන් නම් කරන්න.

01. දෙවන විමලධර්මසූරිය රජතුමා.
02. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා. (ලකුණු 02)

(ii) ලන්දේසීන් හා දෙවන රාජසිංහ රජු අතර පෘතුගීසීන් පලවා හැරීම සඳහා ඇති කරගත් එකඟතාවයන් 02 නම් කරන්න. (ලකුණු 04)

(iii) ලන්දේසීන්ගේ පාලන සංවිධානයේ ආණ්ඩුකාරවරයා හා කොමදෝරුවරුන්ට පහළින් පැවති පරිපාලනය කොටස් 03 කට බෙදා දක්වයි. එම කොටස් 03 න් 02 ක් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 05)

03. (i) ටොරින්ටන් සාමිවරයා විසින් හඳුන්වාදුන් බදු වර්ග 02 ක් ලියන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු A, B, C, D අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A - ලංකාවේ ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා.

B - වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිට වූ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා.

C - උඩරට රාජධානිය සම්බන්ධ උපායශීලි ප්‍රතිපත්තිය අනුගමනය කළ ආණ්ඩුකාරවරයා

D - උඩරට ගිවිසුම අත්සන් කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා. (ලකුණු 04)

(iii) 1818 නිදහස් සටනට බලපෑ හේතු 02 ක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

04. (i) විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා ප්‍රතිසංස්කරණය කරන ලද වැව් 02 ක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) රබර් වගාවේ උන්නතියට බලපෑ හේතු 02 ක් ලියන්න. (ලකුණු 04)

(iii) 01. සමුපකාර සමිති ව්‍යාපාරය ආරම්භ කළ ආණ්ඩුකාරවරයා කවුරුන්ද? (ලකුණු 01)

02. එම ව්‍යාපාරය පිහිටුවීමේ අරමුණු 02 ක් නම්කර පැහැදිලි කරන්න. (ලකුණු 04)

05. (i) දේශීය සංස්කෘතියේ අගය ජනතාවට වටහා දුන් කැපී පෙනෙන නායකයන් 02 දෙනක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පංච මහා වාද අතරින් 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ 02 ක් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. (i) උපකාරක ගිවිසුම් ක්‍රමය යටතේ බ්‍රිතාන්‍යයන් යටත් කරගත් ඉන්දියානු ප්‍රදේශ 02 ක් නම් කරන්න. (ලකුණු 02)


(ii) පහත ජාතීන් අතර ආගමික හා සංස්කෘතික පිබිදීමට මුල් වූ සංවිධාන 02 බැගින් ලියා දක්වන්න.

01. හින්දු ජනතාව.

02. මුස්ලිම් ජනතාව. (ලකුණු 04)

(iii) මහත්මා ගාන්ධිතුමා විසින් ගෙන යන ලද සටන් ව්‍යාපාර 02ක් වන චම්පරන් ව්‍යාපාරය හා ඛේඩා ව්‍යාපාරය පිළිබඳ වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. පහත සඳහන් උපකාරක පද යොදාගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




**පහලට**

01. දණ්ඩි පා ගමනේ ආරම්භක ස්ථානය.

02. ඉන්දියානුවන්ගේ නිදහස සීමා කිරීමට උත්සහ කරන ලද පණත.

03. පෘතුගීසින් විසින් සකස් කරන ලද ලේඛන විශේෂයකි.

04. ආසියාවේ ලන්දේසි බලය පැතිර වූ ලන්දේසි ජාතිකයා.

**හරහට**

03. 1668 දී ප්‍රංශ ජාතිකයන් වෙළඳ ගබඩාවක් ඉදිකරන ලද ස්ථානය.

04. බෞද්ධ ප්‍රකාශනයකි.

05. ඉන්දියාවේ අවසන් මුගල් අධිරාජ්‍යයා.

06. ඉන්දියානු ජාතික සංගමයේ නිර්මාණ ශිල්පියා.

07. වෙළඳ අංශයේ ජ්‍යේෂ්ඨ වෙළෙන්දා මෙලෙස හඳුන්වයි.

08. මෙරටට ලන්දේසින් පැමිණීම නිසා ................ ජාතිකයන් මෙරට සමාජයට එකතු විය.

09. දිවයිනේ ලන්දේසින් යටතේ පැවති පාලන ප්‍රදේශ හැඳින්වූ නාමය. (ලකුණු 11)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
Second Term Test - Grade 09 - 2024

## ඉතිහාසය

පිළිතුරු පත්‍රය

I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) (ii) | (6) අගාඛාන් | (11) (✓) | (16) පිස්කල්/ගම්පති/දිසාවේ |
| (1) (iii) | (7) වලිසිංහ හරිස්චන්ද්‍ර | (12) (x) | (17) මැක්ඩෝවල් |
| (3) (iv) | (8) කිවි | (13) (✓) | (18) වෙල්ලෝරයට |
| (4) (i) | (9) මාතලේ | (14) (✓) | (19) බෞද්ධ |
| (5) (iii) | (10) 1766 | (15) (x) | (20) සිං සභා |

(ලකුණු 2x20=40)

II පත්‍රය

I - **කොටස**

(1) (අ) (i) පෙරදිග ඕලන්ද වෙළඳ සමාගමේ ලාංඡනය / Voc ලාංඡනය
(ii) 1602 (iii) ලන්දේසි /ඕලන්ද (iv) ජාවා (ලකුණු 04)

(ආ) (i) මංගල් පාණ්ඩේ (ii) සිපොයි කැරැල්ල (iii) එන්පීල්ඩ් (iv) බහදූර් ෂා (ලකුණු 04)

(ඇ) (i) කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා (ii) ඇමරිකාවේ නිව් ජර්සි ප්‍රාන්තය
(iii) හෙලේනා බ්ලැවැට්ස්කි මැතිනිය (iv) පරම විඥානාර්ථ සමාගම (ලකුණු 04)

(ඈ) (i) D (ii) පාකිස්ථානය (ලකුණු 02)

(ඉ) (i) C (ii) මීගමුව (ලකුණු 02)

(2) (i) 1 කලන් අල්බස් , 2. කොර්නේලියස් ටැකල් (ලකුණු 02)
(ii) කුරුදු වෙළඳාමේ අයිතිය , නැගෙනහිර වෙරළේ වරායක් (ලකුණු 04)
(iii) සිවිල් පාලනය, හමුදා පාලනය, වෙළඳ අංශය (මින් කරුණු 02 කෙටියෙන් පැහැදිලි කර තිබිය යුතුය) (ලකුණු 05)

(3) (i) මුද්දර බද්ද, තුවක්කු බද්ද, මලු බද්ද, ඔරු පාරු බද්, වෙළඳසැල් බද්ද, කරත්ත බද්ද, ඇඟ බද්ද (ලකුණු 02)
(ii) A - ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා.
B - වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරවරයා.
C - තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා.
D - රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවයා. (ලකුණු 04)
(iii) රජෙකු නොමැතිවීමේ කලකිරීම. ,
බ්‍රිතාන්‍ය පාලනය යටතේ බුදුදහමේ විනාශවෙතැයි බිය.
වෙල්ලස්සේ මඩිගේ මුහන්දිරම් වශයෙන් හජ්ජි මරික්කාර් නැමැති මුස්ලිම් ජාතිකයෙකු පත් කිරීමට සිංහල ජනයා විරුද්ධ වීම.
රඳල ප්‍රධානීන්ගේ බලතල, වරප්‍රසාද හා අදායම් මාර්ග සුරක්ෂිත කිරීම.
දේශීය සම්ප්‍රදායන් හා සිරිත් විරිත් නොසලකා බ්‍රිතාන්‍යයන් සිදු කරනු ලැබූ පරිපාලන හා නීති ප්‍රතිසංස්කරණ නිසා ජන ජීවිතය වියවුල් වීම. (පිටු අංක 35 මින් කරුණු 02 ක් කෙටියෙන් පැහැදිලි කර තිබිය යුතුය) (ලකුණු 05)

(4) (i) බසවක්කුලම වැව, තිසා වැව, මැදවච්චිය මහ වැව, කන්තලේ වැව (ලකුණු 02)

(ii) මෙරට රබර්වලට ඇමරිකා එක්සත් ජනපදයේ විශාල ඉල්ලුමක් පැවතීම.
පළමු ලෝක යුද්ධයෙන් පසු ලෝක වෙළඳපලේ රබර් මිල ඉහළ යාම.
යුරෝපයේ මෝටර් රථ කර්මාන්තය දියුණුවට පත්වීම සහ රබර්වලට ඇති ඉල්ලුම ඉහළ යාම.
රබර් වගාවට උචිත පසක් හා දේශගුණ තත්වයක් මෙරට පැවතීම. (ලකුණු 04)

(iii) 1. මැකලම් ආණ්ඩුකාරවරයා (ලකුණු 01)
2. ගොවි ජනතාවට අඩු පොලියට ණය ලබාදීම.
ණය බර අඩු කොට ගොවි ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම.
රටේ ගොවිජනතාගේ ශුභ සාධනය ඉහළ නැංවීම.
සමූපකාර ව්‍යාපාරය ශක්තිමත් කිරීම තුළින් ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම.
((පිටු අංක 51 මින් කරුණු 2 ක් කෙටියෙන් පැහැදිලි කර තිබිය යුතුය.) (ලකුණු 04)

(5) (i) අනගාරික ධර්මපාලතුමා, වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා, පියදාස සිරිසේන මහතා, ජෝන් ද සිල්වා මහතා (ලකුණු 02)

(ii) බද්දේගම වාදය, වරාගොඩ වාදය, උදන්විට වාදය, ගම්පොළ වාදය, පානදුරා වාදය. (ලකුණු 04)

(iii) පිරිවෙන් පිහිටුවීම. , මුද්‍රණාල පිහිටුවීම හා මුද්‍රිත මාධ්‍ය යොදාගැනීම. , වාද විවාද පැවැත්වීම, බෞද්ධ පාසල් පිහිටුවීම, දේශීය සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම. (පිටු අංක 57, 58,59,60,61, 62,63 මින් කරුණු 02 ක් කෙටියෙන් පැහැදිලි කර තිබිය යුතුය.) (ලකුණු 05)

(6) (i) හයිද්‍රාබාද් , මයිසූර් (ලකුණු 02)

(ii) 1. ප්‍රාර්ථනා සමාජය, ආර්ය සමාජය, (ලකුණු 02)
2. අහමඩියා, අලිගාර් (ලකුණු 02)

(iii) චම්පරන් ව්‍යාපාරය- බිහාර් ප්‍රාන්තයේ චම්පරන් දිස්ත්‍රික්කයේ ඉන්ඩිගෝ වගා කළ ගොවි ජනතාවගේ දුක් ගැනවිලි වලට මැදිහත් වී විසඳීමට මහත්මා ගාන්ධිතුමා ගෙනගිය සටහනයි.
ඛේඩා ව්‍යාපාරය - ගුජාරාටයේ ඛේඩා ප්‍රදේශයේ වසංගත රෝග හා නියඟය නිසා බදුගෙවීමට නොහැකිව සිට ජනතාවට සහන ලබාදීමට මහත්මා ගාන්ධිතුමා ගෙන ගිය සටනයි.(ලකුණු 05)

(7) පහළට
01. සබරමති. 02. රෝලට් 03. තෝම්බු 04. පීටර් සර් කුන්
හරහට
03. සුරාට් 04. සරසවි සඳරැස 05. ඖරංසෙබ් 06. හියුම් 07. ඔපර් හුෆ්ට්
08. බර්ගර් 09. කොමාන්ඩරි (ලකුණු 11)